# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College
## දෙවන වාර වැඩ පැවරුම් අංක 10 -2020
## මව්බස

Name / Index No :.......................................................... **Grade 3**

**2020.06.09 සිට 2020.06.15 දක්වා මව්බස වැඩ පැවරුම කරවන්න.**

**3 ශ්‍රේණිය සියලුම පන්ති සඳහා - දෙවන වාරය**

වැඩ පැවරුම සිදුකිරීම සඳහා උපදෙස්,

- මෙම වැඩ පැවරුමේ දිනය යොදා දිනට නියමිත වැඩ මව්බස ලිවීම පොතේ කරවන්න. පිළිවෙළින් අලවන්න.
- **හැකි අය මෙම අභ්‍යාස තනි පැත්තට මුද්‍රණය කර ගැළපෙන ලෙස කොටස් කපා මව්බස පොතේ අලවන්න.**
- මෙම පැවරුමේ ඇතැම් කොටස් " සිංහල පැවරම් " ( ඡේද කපන පොත ) හි තිබේ. එම පොතෙන් එම කොටස කපා පිළිතුරු ලියා අලවන්න.
- අසා ලිවීම අදාල පොතේ සිදු කරවන්න.
- දරුවා පැවරුම සිදුකර අවසාන වූ පසු සහය වන වැඩිහිටියා විසින් වැරදි යමක් වේ නම් එය යටින් තද නිල් පැහැ පාට පැන්සලෙන් යටින් ඉරක් අඳින්න. එයට ඉදිරියෙන් දරුවා ලවාම නිවැරදි පිළිතුරු ලියවන්න.
- පාඩමට අදාළ Whatsapp මගින් Video Clips, Audio Clips එවා ඇත්නම් පෙන්වා දී පැහැදිලි කර දෙන්න.

**2020/06/09 අඟහරුවාදා දිනට**

01. පහත සඳහන් මාතෘකාවට අදාළ පින්තූරය ඇඳ, තමා එම චරිතය යැයි සිතා වාක්‍ය 5 ක් ලියන්න.

සමනලයා

Richmond College - Grade 3 – 2020

1. ..............................................................................................................................

..............................................................................................................................

2. ..............................................................................................................................

..............................................................................................................................

3. ..............................................................................................................................

..............................................................................................................................

4. ..............................................................................................................................

..............................................................................................................................

5. ..............................................................................................................................

..............................................................................................................................

02. "සිංහල පැවරුම්" හි තිබෙන "වලස් පවුල" කතන්දරය කියවන්න.

03. එම කතන්දරයේ පහත දැක්වෙන වචන කොටු කිරීමට පවසන්න.

1) කීකරුයි = අකීකරුයි (පද දෙකම නිල්පාටින්)

2) ප්‍රශ්න = පිළිතුරු (පද දෙකම කොළපාටින්)

3) ගැළපෙන = නොගැළපෙන (පද දෙකම රතුපාටින්)

4) සෙමෙන් = වේගයෙන් (පද දෙකම කහපාටින්)

5) පුරුදු = නොපුරුදු (පද දෙකම රෝසපාටින්) කොටු කරන්න.

04. මව්බස ලිවීම පොතේ ,

| විරුද්ධාර්ථ පද |
|---|
| යම් වචනයකට සම්පූර්ණයෙන් වෙනස් (විරුද්ධ අර්ථය ලබා දෙන ) වචන විරුද්ධාර්ථ පද ලෙස හැඳින්වේ. |

ලෙස ලියා "සිංහල පැවරුම්" හි තිබෙන " වලස් පවුල " කොටස කපා අලවන්න.

Richmond College - Grade 3 – 2020

05. මෙම පැවරුම මව්බස ලිවීම පොතේ ලියා සම්පූර්ණ කරන්න.

- ගැලපෙන විරුද්ධාර්ථ පදය කොටුවෙන් තෝරා ඉදිරියෙන් ලියන්න.

1) කීකරුයි - ...........................................
2) නොගැළපෙන - ...........................................
3) වේගයෙන් - ...........................................
4) පුරුදු - ...........................................
5) ප්‍රශ්න - ...........................................

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **අකීකරුයි** | , | **පිළිතුරු** | , | **ගැළපෙන** | , | **සෙමෙන්** | , | **නොපුරුදු** |

Grade 3 – 2020

**2020/06/10 බදාදා දිනට**

01. "සිංහල පැවරුම්" හි පිටු අංක 17 හි තිබෙන " ක්‍රියාකාරකම 03 පියවර 1 " කොටසේ හිස්තැන් පුරවා කපා මව්බස ලිවීම පොතේ අලවන්න..

- නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පිරවීමට උපදෙස් ලබා දෙන්න.
  - * ඉතා . . . . . . දුවගෙන ගිය නිපුන් තරගයේ පළමුවැනියා විය.
  - * තරගයේ අන්තිමයා වූයේ . . . . . . දුවගෙන ගිය තාරක ය.

(සෙමෙන් - වේගයෙන්)

  - * වලස් අයියා හරි ම . . . . . . . . යි.
  - * වලස් මල්ලී හරි ම . . . . . . . . . යි.

(කීකරු - අකීකරු)

  - * විභාගයට . . . . . . . . දහයක් තිබිණි.
  - * ඒවාට . . . . . . . . ලිවීම ඉතා පහසු විය.

(ප්‍රශ්න - පිළිතුරු)

  - * . . . . . . . . . . . රූපයට වචනය යා කරන්න.
  - * . . . . . . . . . . . වචනය කපා හරින්න.

(ගැළපෙන - නොගැළපෙන)

  - * වලස් අයියා . . . . . . . . . තැනකින් නැවේ ය.
  - * වලස් මල්ලි . . . . . . . . . තැනකින් නැවේ ය.

(පුරුදු - නුපුරුදු)

02. සිංහල වැඩ පොතේ 63 පිටුව (ක්‍රියාකාරකම 2) සම්පූර්ණ කරන්න.




අග මුල සෙවූ හැටි



2

**2020/06/11 බ්‍රහස්පතින්දා දිනට**

01. සිංහල පැවරුම්" හි පිටු අංක 17 හි තිබෙන " හොඳ දරුවෝ " ඡේදය Whatsapp මගින් එවා ඇති Audio Clip එක අනුකරණය කරමින් කියවන්න.

02. එම ඡේදයේ පහත දැක්වෙන වචන කොටු කිරීමට පවසන්න.

1) ගමන් බිමන් ( දම්පාටින් )

2) අහල පහල ( නිල්පාටින් )

3) කතා බහ (කොළපාටින් )

4) සිරිත් විරිත් (රතුපාටින් )

5) තෑගි බෝග (කහපාටින් )

6) කෑම බීම (රෝසපාටින් ) කොටු කරන්න.

03. මව්බස ලිවීම පොතේ ,

| |
|---|
| යුගල පද |
| යම් වචන දෙකක් එකවර එකට යෙදෙන විට එමවචන යුගල පද ලෙස හැඳින්වේ. |

ලෙස ලියා"සිංහල පැවරුම්" හි තිබෙන" හොඳ දරුවෝ" කොටස කපා අලවන්න.

04. එම යුගල පද මව්බස ලිවීම පොතේ ලියා සම්පූර්ණ කරන්න

05. එම යුගල පද යොදා වැකි සකස් කර මව්බස ලිවීම පොතේ ලියන්න.

උදා; අපේ ගෙදර අහල පහල අය හරි හොඳයි.

**2020/06/12 සිකුරාදා දිනට**

01. රජතුමාගේ ඔටුන්න 11 පාඩම ශබ්දනගා ( අවශ්‍ය තැන් වල හැඟීම් ඉස්මතු වන ආකාරයට ශ්‍රවණපටය අනුකරණය කරමින් ) කියවන්න.

Richmond College - Grade 3 – 2020




## රජතුමාගේ ඔටුන්න

( කියවීම පොතේ 45-50 පිටුව දක්වා )

02. පහත සඳහන් වචන පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න.

1) විවිධ ප්‍රසංගය
2) රටේ තොටේ
3) කසු කුසු
4) මුසා බස්
5) අඳේ
6) සලකා බලන්නම්
7) දණ නමා
8) දැත්

03. සිංහල වැඩ පොතේ 44 පිටුව හා 45 පිටුව




- අවබෝධය
- ක්‍රියාකාරකම 2 සම්පූර්ණ කරන්න.

**2020/06/15 සඳුදා දිනට**

<u>ප්‍රස්තාව පිරුළු</u>

පාඩමේ ඇති ඇතැම් සිද්ධි වඩා රසවත් කොට ඉදිරිපත් කිරීමට යොදා ගෙන ඇති වාක්‍ය කොටස් ප්‍රස්තාව පිරුළු ලෙස හැඳින්වේ.

* ළිඳේ ඉන්න ගෙම්බා වගේ
  - තමා අවට සමාජය පිළිබඳ අවබෝධයක් නොමැති ව සිටීම
* ඉඳිකටුවයි නූලයි වගේ
  - සැමවිටම තමන් සමග තවත් අයෙක් එකට සිටීම
* මඬේ හිටවපු ඉන්න වගේ
  - එක තීරණයක නොසිටීම
* ඉබ්බාගෙන් පිහාටු ඉල්ලනව වගේ
  - කෙනෙකුගෙන් කෙසේ වත් ලබාගත නොහැකි දෙයක් ලබා ගැනීමට උත්සාහ දැරීම
* පරංගියා කෝට්ටේ ගියා වගේ
  - කිට්ටු පාරක් තිබිය දී දුර පාරකින් යෑම

02. ප්‍රස්තාව පිරුළු හා එහි තේරුම මව්බස ලිවීම පොතේ ලියන්න.

Richmond College - Grade 3 - 2020

03. "සිංහල පැවරුම්" හි පිටු අංක 17 හි තිබෙන " ප්‍රස්තාව පිරුළු " ක්‍රියාකාරකම 04 පියවර 3 " කොටසේ හිස්තැන් පුරවා කපා අලවන්න.

හිස් තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා ලියන්න.

- පරංගියා . . . . . . . ගියා වගේ.
- . . . . . . හිටවපු ඉන්න වගේ.
- ඉබ්බාගෙන් . . . . . . ඉල්ලනව වගේ
- . . . . . . . . නූලයි වගේ
- ළිඳේ ඉන්න . . . . . වගේ

(ගෙම්බා/පිහාටු/මඩේ/කෝට්ටේ/ඉඳිකටුවයි)

04. සිංහල වැඩ පොතේ 46 පිටුව හා 47 පිටුව




- ක්‍රියාකාරකම 3 ,
- ක්‍රියාකාරකම 4 සම්පූර්ණ කරන්න.

05. 2020.06.12 දින විශේෂ අවධානයක් යොමුකළ වචන අසා ලියන්න.